# රාජ්‍ය භාෂා ප්‍රවීණතා වාචික පරීක්ෂණය

## රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 අනුව පවත්වන භාෂා පුහුණු පාඨමාලාවන්හි විෂය නිර්දේශ අනුව වාචික පරීක්ෂණ ක්‍රමවේදය

## 01 වන කාණ්ඩය - පැය 200

### 01 කාණ්ඩයට අයත් පැය 200 භාෂා පුහුණු පාඨමාලාවන් හැදෑරිය යුතු තෘතීයික හා ජ්‍යෙෂ්ඨ ගණයේ නිලධාරින් වෙනුවෙන් පැවැත්වීමට සැලසුම් කර ඇති වාචික පරීක්ෂණයෙන් සපුරා ගැනීමට අපේක්ෂිත අරමුණු

**ඉලක්කය :**

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ඵලදායී අයුරින් ක්‍රියාත්මක කිරීම පිණිස සිංහල හා දෙමළ භාෂා කථා කරන ජන කොටස් අතර සමාජ, සංස්කෘතික වෙනස්කම් පිළිබඳව දැනුවත් කිරීම හා ඒවා අගය කිරීම වර්ධනය කිරීම.

**අරමුණු :**

- රාජකාරි ඉටු කිරීම පිණිස ඉලක්කගත භාෂාවේ ශ්‍රවණ, කථන හා කියවීමට අදාළ භාෂා ස්වරූපයන්ගෙන් සන්නිවේදනය කිරීමට හැකියාව අත් කරගැනීම.
- පෙළඹවීම, ප්‍රශංසා කිරීම, ප්‍රතික්ෂේප කිරීම ආදී භාෂාමය කාර්යයන් ඉටු කිරීම පිණිස භාෂාව මැනවින් උපයෝගී කර ගැනීමේ හැකියාව අත් කරගැනීම.
- ඉලක්කගත භාෂාව කථා කරන්නන්ගේ සමාජ-සංස්කෘතික වටිනාකම් ඇගයීමට හැකියාව අත් කර ගැනීම.
- විවිධ පුද්ගලයන් කතා කරන භාෂාවන් (සිංහල, දෙමළ) ඉලක්කගත භාෂාවට (සිංහල, දෙමළ) පරිවර්තනය කර අවබෝධ කර ගැනීමේ හැකියාව අත්කර ගැනීම.

**අන්තර්ගතය :**

**(01) ශ්‍රවණ කුසලතා :**

- ❖ විවිධ අවස්ථා හා සිද්ධිවලට අදාළ සංවාදයන්ට සවන් දී අවබෝධ කර ගැනීම.
- ❖ තම මූලිකත්වයෙන් පැවැත්වෙන රැස්වීම්, සාකච්ඡා ආදියට සවන් දී අවබෝධ කර ගැනීම.
- ❖ එදිනෙදා පැවැත්වෙන කථා හා මාධ්‍ය වැඩසටහන් ආදියට සවන් දී අවබෝධ කර ගැනීම.

- ❖ කථිකයන් පළ කරන හැඟීම් හා මතවලට සවන් දී ඒවායේ අර්ථ අවබෝධ කර ගැනීම.

**(02) කථන කුසලතා :**

- ❖ අදහස් හා හැඟීම් ක්‍රමානුකූලව හා අර්ථානුකූලව ප්‍රකාශ කිරීම.
- ❖ විවිධ සමාජීය හා වෘත්තීමය අවස්ථාවන්හි දී ආචාර සම්පන්නභාවය හා විවිධ ආමන්ත්‍රණ පිළිබඳ සම්ප්‍රදායන්ට අනුකූලව සංවාදයේ යෙදීම.
- ❖ තම වෘත්තියට අදාළ මාතෘකා යටතේ ඉදිරිපත් කිරීම් සිදු කිරීම.
- ❖ ව්‍යාකරණ, පද භාවිතය හා උච්චාරණය නිවැරදි භාවයෙන් යුතුව කථා කිරීම.

**(03) කියවීමේ කුසලතා :**

- ❖ එදිනෙදා කාර්යයන් හා සම්බන්ධ විවිධ ප්‍රකාශන කියවා අවබෝධ කර ගැනීම.
- ❖ තම වෘත්තියට අදාළ තාක්ෂණික හා විද්‍යාත්මක ලේඛන කියවා අවබෝධ කර ගැනීම.
- ❖ විවිධ ප්‍රකාශන, දැන්වීම් ආදිය ඉදිරිපත් කිරීම.

**විභාග පරිපාටිය**

| සංරචකය | කාලය | ප්‍රශ්න පත්‍ර සැකැස්ම | ලකුණු පරිපාටිය | සමත් වීම සඳහා ලබා ගත යුතු අවම ලකුණු |
|---|---|---|---|---|
| 01. ශ්‍රවණය | පැය 01 | කොටස් 4යි.<br>ප්‍රශ්න 40යි. | ලකුණු 100 | ලකුණු 40 |
| 02. කථනය හා කියවීම | මිනිත්තු 15 | කොටස් 4යි. | ලකුණු 100 | ලකුණු 40 |

## 01. ශ්‍රවණ කුසලතා පරීක්ෂණය

විභාග අපේක්ෂකයන්ගේ සිංහල/ දෙමළ භාෂාවේ ශ්‍රවණ කුසලතාව පරීක්ෂා කිරීම සඳහා මෙම පරීක්ෂණය පවත්වනු ලැබේ. එදිනෙදා සමාජ ජීවිතයේ දී හෝ රාජකාරි ජීවිතයේ දී තම අනෙක් රාජ්‍ය භාෂාවෙන් සිදු කෙරෙන කතා බහකට හෝ කරුණු දැක්වීමකට හෝ සාකච්ඡාවකට හෝ දේශනයකට සවන් දී අවබෝධ කරගෙන ඒ ඇසුරින් අසනු ලබන ප්‍රශ්නවලට පිළිතුරු ලබා දීම, රාජකාරි ජීවිතයේ දී තම අනෙක් රාජ්‍ය භාෂාවෙන් අවශ්‍ය වන වචනවලට සවන් දී ඒ ඇසුරින් අසනු ලබන ප්‍රශ්නවලට පිළිතුරු ලබා දීම මෙයින් අපේක්ෂා කෙරේ. පරීක්ෂණයේ දී සවන්දීමට ලැබෙන එවැනි විවිධාකාර හඬපට හොඳින් අසා, තේරුම් ගෙන අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම කළ යුතු ය.

01වන කාණ්ඩයට අයත් නිලධාරින්ගේ තනතුරුවල ස්වභාවයන් හා රාජකාරියේ ස්වභාවයන් අනුව පරීක්ෂණයට අදාළ විෂය ක්ෂේත්‍ර හා මාතෘකා සකස් කර ගනු ලැබේ.

## ප්‍රශ්න පත්‍ර ආකෘතිය

ප්‍රශ්න පත්‍රය කොටස් 04කින් යුක්ත ය. එම කොටස් 4 ප්‍රශ්න 40කින් සමන්විත ය.

- **පළමු කොටස ( ප්‍රශ්න 10යි )**

රාජකාරි කටයුතු ඉටුකිරීමේ දී අවශ්‍ය වන වචනවලට සවන් දී ඒ ඇසුරින් අසනු ලබන ප්‍රශ්නවලට පිළිතුරු ලබා දීම

උදා: නිල නාම (කොමසාරිස් / අධ්‍යක්ෂ)
සුබ පැතීම්
විධාන
රාජකාරි ලේඛන නාම ( නිවාඩු ඉල්ලුම්පත/ පැමිණීමේ ලේඛනය)

(මෙවැනි වචන ඇතුළත් හඬපටයකට සවන් දී එම වචන ලිවීම, වචනවලට සවන් දී නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් ඇඳීම, එක් භාෂාවකින් වචන කියන අතර අනෙක් භාෂාවෙන් ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් ඇඳීම, වචනවලට සවන් දී ඒවා ප්‍රකාශ කරන අනුපිළිවෙළට අංක යෙදීම, වචනවලට සවන් දී ඒවා හරි නම් √ ලකුණ ද වැරදි නම් x ලකුණ ද යෙදීම වැනි ආකාරවලින් ප්‍රශ්න සකස් කළ හැකිය.)

- **දෙවන කොටස ( ප්‍රශ්න 10යි )**

අදාළ භාෂාවෙන් ඉදිරිපත් කරන දින, වේලාවන්, සංඛ්‍යාවලට සවන් දී ඒ ඇසුරින් අසනු ලබන ප්‍රශ්නවලට පිළිතුරු ලබා දීම

උදා : පෙ.ව. 09.00
157

( දින, වේලාවන්, සංඛ්‍යා ඇතුළත් හඬපටයකට සවන් දී වචනයෙන් ලිවීම, සවන් දී ඉලක්කමින් ලිවීම, සවන් දී නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් ඇඳීම වැනි ආකාරවලින් ප්‍රශ්න සකස් කළ හැකිය.)

- ❖ **තෙවන කොටස ( ප්‍රශ්න 10යි )**

සරල කෙටි වාක්‍යවලට සවන් දී ඒවායේ පරිවර්තන වාක්‍ය නිවැරදි ද පරීක්ෂා කිරීම

උදා: කොමසාරිස්තුමා පිළිගැනීමේ කථාව පැවැත් වූයේ ය.

(මෙවැනි වාක්‍ය ඇතුළත් හඬපටයකට සවන් දී පරිවර්තනය වැරදි ඇති ස්ථානය තෝරා යටින් ඉරක් ඇඳීම, සවන් දී නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් ඇඳීම, සවන් දී පරිවර්තනය හරි නම් √ ලකුණ ද වැරදි නම් x ලකුණ ද යෙදීම වැනි ආකාරවලින් ප්‍රශ්න සකස් කළ හැකිය.)

- ❖ **හතරවන කොටස ( ප්‍රශ්න 10යි )**

පුද්ගලයන් දෙදෙනෙකු හෝ තිදෙනෙකු අතර සිදුවන සංවාදයක් ඇසුරින් ප්‍රශ්න ඇසීම හෝ කිසියම් විෂය ක්ෂේත්‍රයක් පිළිබඳ ව ගුරුවරයෙකු, දේශකයෙකු ආයතන ප්‍රධානියෙකු විසින් කෙරෙන දේශනයක්/කථාවක් ඇසුරින් ප්‍රශ්න ඇසීම

උදා: වැඩසටහනක් සංවිධානය කිරීම පිළිබඳ සංවාදයක්
ප්‍රාදේශීය ලේකම්වරයෙකු කරන කථාවක්
පරිසර දිනය වෙනුවෙන් සංවිධානය කරන ලද වැඩසටහනක කෙරෙන දේශනයක්

(සංවාදයක් හෝ දේශනයක් ඇතුළත් හඬපටයකට සවන් දී හිස්තැන් පිරවීම, නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් ඇඳීම, දෙන ලද ප්‍රකාශ හරි නම් √ ලකුණ ද වැරදි නම් x ලකුණ ද යෙදීම, වැරදි ඇති ස්ථානය තෝරා යටින් ඉරක් ඇඳීම, දක්වා ඇති ප්‍රකාශයන් හඬපටයේ අනුපිළිවෙළට සකස් කිරීම වැනි ආකාරවලින් ප්‍රශ්න සකස් කළ හැකිය.)

**විභාග කාලය හා හඬපටය ක්‍රියාත්මක කිරීම**

- කාලය පැය 01යි. (සම්පූර්ණ විභාග කාලය)
- එහි දී එක් කොටසකට විනාඩි 03ත් 06ත් අතර කාලයක් සහිත හඬ පටයක් වශයෙන්, කොටස් 04 සඳහා හඬපට 04ක් ශ්‍රවණයට සැලසේ. (එක් එක් කොටසෙහි ස්වභාවය අනුව කාලය වෙනස් වේ.)
- එක් කොටසකට අදාළ හඬපටයක් ශ්‍රවණයට අවස්ථා 2ක් හෝ එක් වාක්‍යයක් හෝ වචනයක් 2වරක් ශ්‍රවණයට අවස්ථාව ලැබේ.
- හඬ පටයක් ක්‍රියාත්මක කිරීමට පෙර ප්‍රශ්න පත්‍රයේ අදාළ කොටස කියවා ගැනීමට විනාඩි 03ක් ලැබේ.
- හඬ පටයක් ක්‍රියාත්මක වීමට ගත වන කාලයට පසුව පිළිතුරු සම්පූර්ණ කර ගැනීමට විනාඩි 03ක් ලබා දේ.

- අමතරව කාලය ඉතිරි වුවහොත් එම කාලය ප්‍රශ්න පත්‍රය ලබා දීමට පෙර උපදෙස් දීම, ප්‍රවේශ පත්‍ර අත්සන් කිරීම, විභාග අංකය ලිවීම ආදී කාර්යය සඳහා හා විභාගය පවතින කාලයේ දී, ඒ ඒ කොටස අතරතුර දී උපදෙස් ලබා දීමට වැය කරනු ලැබේ.

- ඒ අනුව කොටස් 04 සඳහා වැය කිරීමට අපේක්ෂිත කාලය පහත පරිදි වේ.

| කොටස | ආරම්භයට පෙර කාලය විනාඩි | හඬපටයේ කාලය විනාඩි | ක්‍රියාත්මකවන වාර ගණන | අවසන් වීමෙන් පසු කාලය විනාඩි | එක් කොටසකට කාලය විනාඩි |
|---|---|---|---|---|---|
| 01 | 03 | 04 | එක් වචනයක් දෙවරක් බැගින් | 03 | 10 |
| 02 | 03 | 04 | එක් වචනයක් /ඉලක්කමක් දෙවරක් බැගින් | 03 | 10 |
| 03 | 03 | 06 | එක් වාක්‍යයක් දෙවරක් බැගින් | 03 | 12 |
| 04 | 03 | 06 | සම්පූර්ණ සංවාදය හෝ දේශනය (දෙවරක්) පළමුවර | 03 | 21 |
| | | 06 | සම්පූර්ණ සංවාදය හෝ දේශනය දෙවනවර | 03 | |
| | | | | **කාලය විනාඩි** | **53** |

- ඒ ඒ කොටසට අදාළ ප්‍රශ්න ඉදිරිපත් කර ඇත්තේ හඬ පටයේ ගලා යාමට අනුව ය.
- එක් වචනයක් හෝ දෙකක් පිළිතුරකට ලැබෙන පරිදි හිස්තැන් පිරවීම, √ හෝ × ලකුණු යෙදීම, අංක යෙදීම, නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් ඇදීම වැනි ශ්‍රවණ හැකියාව පරීක්ෂා කළ හැකි ක්‍රමවේදවලින් එකක් හෝ කිහිපයක් යටතේ සකස් වූ ප්‍රශ්න පත්‍රයකි.

## පිළිතුරු පත් පරීක්ෂාව හා ලකුණු ලබා දීම

- සමස්ත ප්‍රශ්න පත්‍රය සඳහා ම ලකුණු 100ක් හිමි වේ.
- එක් ප්‍රශ්නයකට ලකුණු 2.5 ක් හිමිවේ.
- අක්ෂර වින්‍යාසය දෝෂ සහිත පිළිතුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.
- පිළිතුරු ලිවීමේ දී ව්‍යාකරණ කෙරෙහි අවධානය යොමු කළ යුතු ය. ව්‍යාකරණ දෝෂ ඇත්නම් වැරදි පිළිතුරක් සේ සැලකේ.
- අපැහැදිලි පිළිතුරු වැරදි පිළිතුරු සේ සැලකේ.

- පිළිතුරු ඉදිරිපත් කිරීමට ලබා දී ඇති ක්‍රමවේද උදාහරණ ලෙස හරි නම් √ ලකුණ යෙදීම වැනි අවස්ථාවලදී අදාළ ලකුණු යෙදීම හැර වෙනත් ආකාරයෙන් සපයා ඇති පිළිතුරු භාර ගනු නොලැබේ.

**ශ්‍රවණ කුසලතා පරීක්ෂණයට පෙනී සිටීමේ දී විභාග අපේක්ෂකයන්ට යොදාගත හැකි උපාය මාර්ග**

- ප්‍රශ්න පත්‍රය ලබා දුන් පසු අනුපිළිවෙළට 01 කොටස සිට 04 කොටස දක්වා අදාළ හඬපට ශ්‍රවණයට අවස්ථාව සැලසේ.
- හඬපටයක් ශ්‍රවණයට ලැබෙන්නේ දෙවරක් පමණි. හඬ පටයක් ක්‍රියාත්මක කිරීමට පෙර ලැබෙන විනාඩි 03ක් ඇතුළත එම අවස්ථාවට අදාළ ප්‍රශ්න සහිත කොටස පමණක් ඉතා හොඳින් කියවා ගැනීමට වග බලා ගත යුතු ය.
- යහපත් මානසික ඒකාග්‍රතාවකින් යුතු ව, දී ඇති උපදෙස් හා ඒ අවස්ථාවේ දෙනු ලබන උපදෙස් අවබෝධයට ගත යුතු ය.
- හැකි සෑම අවස්ථාවක ම හඬපටයේ ගලා යාමට අනුකූලව ප්‍රශ්න සකස් කර ඇති බැවින් හඬපටය ශ්‍රවණය කරන අතර ම ක්‍රමානුකූලව ප්‍රශ්න පත්‍රයේ අදාළ කොටස පරීක්ෂා කළ යුතු ය. ඒ අනුව අදාළ පිළිතුර හඳුනා ගැනීමට පහසු වේ.
- පරීක්ෂණය පවත්වන කාලය තුළ මනා සංයමයකින් යුතු ව තම කන, ඇස හා මනස මෙහෙයවිය යුතු ය.

## 02. කථන හා කියවීමේ කුසලතා පරීක්ෂණය

සිංහල/ දෙමළ භාෂාවෙන් යමක් ප්‍රකාශ කිරීමේ හැකියාව පරීක්ෂා කිරීම සඳහා මෙම පරීක්ෂණය පවත්වනු ලැබේ. නිරවුල් සහ පැහැදිලි ලෙස අදහස් ප්‍රකාශ කිරීම, නිවැරදි උච්චාරණය, උචිත වචන භාවිතය පිළිබඳ මෙහි දී අවධානය යොමු කෙරේ. එසේ ම විරාම ලක්ෂණ කෙරෙහි අවධානය යොමු කරමින් නියමිත කාලය තුළ කියවීම පැහැදිලිව ශබ්ද නඟා කියවීම කළ යුතුය.

02වන කාණ්ඩයට අයත් නිලධාරින්ගේ තනතුරුවල ස්වභාවයන් හා රාජකාරියේ ස්වභාවයන් අනුව පරීක්ෂණයට අදාළ විෂය ක්ෂේත්‍ර හා මාතෘකා සකස් කර ගනු ලැබේ.

**පරීක්ෂණයේ ආකෘතිය**

කථන පරීක්ෂණය පියවර 4කින් යුක්ත වේ.

❖ **පිවිසුම (විනාඩි 01) - ලකුණු හිමි නොවේ.**

පරීක්ෂණය ආරම්භයේ දී විභාග අපේක්ෂකයාගේ මානසික ඒකාග්‍රතාව ඇති කිරීමට හා විභාගය කෙරෙහි ඇති බිය අවම කිරීම අරමුණු කර ගනිමින් කෙටි සුහද සංවාදයක් පවත්වනු ලැබේ. මේ සඳහා ලකුණු හිමි නොවේ. විනාඩි 01ක කාලයක් පමණක් ගනු ලැබේ.

❖ **පළමුවන කොටස (විනාඩි 04) - ලකුණු 25**

පරීක්ෂකයා අපේක්ෂකයාට පළපුරුදු කරුණු පිළිබඳ විමසා සිටියි. (ප්‍රශ්න 10ක් ඇතුළත්ය.)

උදා: පදිංචි ප්‍රදේශය , රැකියාව , කාර්යාලය, පැවරී ඇති රාජකාරි
(සරල වාක්‍යවලින් හා කෙටි පිළිතුරුවලින් පිළිතුරු සැපයීම)

❖ **දෙවන කොටස (විනාඩි 03) - ලකුණු 25**

විභාග අපේක්ෂකයාට පින්තූරයක් තෝරා ගැනීමට සලසයි. පින්තූරය පරීක්ෂා කර සූදානම් වීමට විනාඩි 01ක් ලබා දෙන අතර විනාඩි 02ක කාලයක දී ඊට අදාළ ව කරුණු ඉදිරිපත් කළ යුතු ය.

❖ **තෙවන කොටස (විනාඩි 04) - ලකුණු 25**

පරීක්ෂකයා හා විභාග අපේක්ෂකයා අතර දෙන ලද මාතෘකාවකට අනුව සංවාදයක් පැවැත්වීම. (සංවාද මාතෘකා සපයනු ලැබේ .)

❖ **හතරවන කොටස (විනාඩි 03) - ලකුණු 25**

විභාග අපේක්ෂකයාට දෙන ලද ඡේදයක් ශබ්ද නඟා කියවීමට අවස්ථාව සලසයි. එම ඡේදය කියවීමට සූදානම් වීමට විනාඩි 01ක් ලබා දෙන අතර ශබ්ද නඟා කියවීම සඳහා විනාඩි 02ක් හිමි වේ.

- විභාග කාලය විනාඩි 15යි.
- සමස්ත පරීක්ෂණය සඳහා ම ලකුණු 100ක් හිමි වේ.

## පරීක්ෂා කරන ක්‍රමවේදය සහ ලකුණු ලබා දීම

කථන කුසලතා ඇගයීම් පරීක්ෂණයේ දී නිර්ණායක 05ක් යටතේ විභාග අපේක්ෂකයාගේ දක්ෂතාව පරීක්ෂා කරනු ලැබේ.

1. චතුර බව හා සුසංයෝගය
2. වාක්කෝෂය
3. ව්‍යාකරණය
4. උච්චාරණය
5. කාල කළමනාකරණය

### 1. චතුර බව හා සුසංයෝගය

යම් මාතෘකාවකට අනුව කථා කිරීමේ දී කරුණු ඉදිරිපත් කරන චතුර බව හා එම කරුණු ගළපා ගන්නා ආකාරය පරීක්ෂා කරනු ලැබේ.

### 2. වාක්කෝෂය

විභාග අපේක්ෂකයාගේ දැනුවත්භාවය අනුව භාවිත කරන වචන හා කරුණු ඉදිරිපත් කිරීමේ දී යොදා ගනු ලබන වචන හා ඒවායේ උචිත අනුචිත ස්වභාවය පිළිබඳ පරීක්ෂාවට ලක් කරනු ලැබේ. හැකිතාක් අදාළ භාෂාවෙන් ම වචන ඉදිරිපත් කළ යුතු ය. ( ඉංග්‍රීසි වචන භාවිතයෙන් තොරව)

### 3. ව්‍යාකරණය

මෙහි දී අදාළ භාෂාවේ පවතින ව්‍යාකරණ රීති අනුගමනය කරමින් කථනයේ යෙදීම කෙරෙහි අවධානය යොමු කෙරේ.

### 4. උච්චාරණය

නිවැරදි සහ පැහැදිලි උච්චාරණයේ යෙදෙන්නේ ද යන්න පිළිබඳ මෙහි දී අවධානය යොමු කරයි.

### 5. කාල කළමනාකරණය

නියමිත කාල පරාසය තුළ සාර්ථක ලෙස කරුණු දැක්වීම හෝ කියවීම සිදු කරන්නේ ද යන්න පිළිබඳ අවධානය යොමු කරයි.

මෙම කරුණු 05 කෙරෙහි අවධානය යොමු කරමින් ලකුණු තීරණය කිරීමේ දී පහත පරිදි කටයුතු කළ යුතු ය.

පරීක්ෂණයේ දී එක් කොටසකට ලකුණු 25ක් ලබා දෙන්නේ නම් එම ලකුණු අදාළ නිර්ණායක පහක් (05) යටතේ පහත පරිදි වෙන් වේ.

| | **චතුර බව හා සුසංයෝගය (05)** | **වාක්කෝෂය (05)** | **ව්‍යාකරණය (05)** | **උච්චාරණය (05)** | **කාල කළමනාකරණය (05)** |
|---|---|---|---|---|---|
| ඉතා හොඳයි | 5 | 5 | 5 | 5 | 5 |
| හොඳයි | 4 | 4 | 4 | 4 | 4 |
| තරමක් හොඳයි | 3 | 3 | 3 | 3 | 3 |
| දුර්වලයි | 2 | 2 | 2 | 2 | 2 |
| ඉතා දුර්වලයි | 1 | 1 | 1 | 1 | 1 |
| කිසිත් නැත | 0 | 0 | 0 | 0 | 0 |